479 - 13

# සිංහල භාෂාවේ වාක්‍ය රටා

ආචාර්ය කනංගමුවේ රාහුල හිමි

## භාෂාව අර්ථ නිරූපණය

"භාෂ්" ධාතුවෙන් නිපන් "භාෂා" යන පදයෙන් **සිතෙහි අදහස් පැවසීමට ඉවහල් වන ශබ්ද සමූහය**[1] අර්ථ ගන්වයි. දෙඩීම, බිනීම, කතා කිරීම යන්න එහි සරලාර්ථය වේ. මිනිස් සිතෙහි හටගන්නා වූ සිතුවිලි සමුදාය අන්‍යයන් වෙත ප්‍රේරණය කිරීමේ ප්‍රබලතම මාධ්‍ය භාෂාවයි. ලෝකය තුළ මිනිසා අසහාය තත්වයක් ලබා ගෙන සිටින්නේද මේ භාෂා ශක්‍යතා නිසාවෙනි. සිතුවිලි උසුලන්නා හෙවත් ප්‍රවාහනය කරන්නා "භාෂාව" බැවින් මානව සංස්කෘතියේ පදනම භාෂාව වශයෙන් සැලකිය හැකිය. මානව සංස්කෘතිය පරපුරෙන් පරපුරට උරුම කර දෙන්නේද සමාජ සම්බන්ධතා ගොඩ නගා ගෙන පවත්වා ගෙන යන්නේද "භාෂාව" නිසා බැවින් මිනිසා අතර පවත්නා සමාජ බැම්ම වශයෙන් භාෂාව හඳුනා ගැනීමට පුළුවන. භාෂාව අර්ථ ගැන්වීම සඳහා වාග් විද්‍යාඥයන්, සමාජ මානව විද්‍යාඥයන්, මෙන්ම සමාජ විද්‍යාඥයන් විවිධ නිර්වචන හඳුන්වා දී තිබේ.

"ශබ්ද උච්චාරණය හා ශ්‍රවණය මගින් මිනිසුන් අතර හැඟීම් හා අදහස් හුවමාරු කර ගන්නා මාර්ගය භාෂාවයි."[2]

මිනිස් සන්තානය තුළ පහළ වන හැඟුම් සමුදාය ශබ්ද බවට හරවා අන්‍යයන්ට ප්‍රකාශ කළ යුතුය. සන්නිවේදන කාර්යය

[1] ''පූජනා'', අතිපූජ්‍ය කණුමුල්දෙනියේ උපාලි මහාස්වාමීන්ද්‍ර ගුණානුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. ආචාර්ය රාජකීය පණ්ඩිත, කොටියාගල උපරතන හිමි, ගෞරව ශාස්ත්‍රවේදී ඇත්බටුවේ විනීත හිමි, 2016



සිදුවන්නේ එවිටයි. සිතුවිලි දැරීමද භාෂාවේම කොටසක් බව මෙහිදී අමතක කළ යුතු නැත. ශබ්ද උච්චාරණයේදී මූලික වශයෙන් ඉන්ද්‍රිය සමූහයක් ක්‍රමානුකූලව චලනය කළ යුතුය. ශබ්ද උච්චාරණයේදී උපකාරීවන එම ඉන්ද්‍රිය පද්ධතියට උච්චාරණ ඉන්ද්‍රිය යැයි වාග්විද්‍යාඥයෝ වහරති. පෙනහළු සෝෂණ තන්තු, උගුර(කණ්ඨය), දිව, දත්, තොල්, මෙන්ම නාශිකාරන්ධ්‍රයද එම ඉන්ද්‍රින්ට ඇතුළත් වෙයි. මේ ඉන්ද්‍රියන්ගේ අබල දුබලතාවක් වුවහොත් ඒ අයට නිවැරදි අර්ථයක් සහිත ශබ්ද පිට කළ නො හැකිය. "භාෂා බාධක ව්‍යාධි" යනුවෙන් හඳුන්වන්නේ එවැනි ආබාධිත තත්වයන්ය.

"භාෂාව නම් මූලික වශයෙන් සන්නිවේදනය වූ අදහස් හා හැඟීම් පළ කිරීම සඳහා වහල්වන කථා ශබ්දමය සංකේත පද්ධතියකි."[3]

" Language is a system of arbitrary vocal symbols, by means of which human beings as members of social group and participants in a culture, interact and communicate....

"The methods of human communication either the spoken or written consisting of the use of words in an agreed way the Language of a particular community or country etc."[4]

භාෂාව වනාහි අත්තනෝමතික වාචික සංකේත පද්ධතියකි. සමාජයේත්, තත් සමාජ සංස්කෘතියේත් නිත්‍ය සාමාජිකත්වය දරන පුද්ගලයා ඔහුගේ හැඟීම් හුවමාරු කර ගැනීමටත්, සන්නිවේදනය කර ගැනීමටත්, උපයෝගි කර ගන්නා ප්‍රධාන මෙවලම භාෂාව වන බව ඉහත නිර්වචනයෙන් අවබෝධ කර ගැනීමට පුළුවන.

"A Language is a system of arbitrary vocal symbols by means of which a social group cooperates"[5]

භාෂාව ක්‍රමවත් සැලැස්මකින්, සංකේතවලින් හා ශබ්දවලින් යුක්ත සම්මුතියෙන් පැණ නැගුනක් බව ඉහත නිර්වචනයෙන් පැහැදිලි වෙයි.

"මිනිසා තම සිත තුළ පහළ වන විවිධ සංකීර්ණ සිතුවිලි සමුදාය පැහැදිලි කර ගැනීමේදී උපයෝගි කර ගනු ලබන්නේ භාෂාවයි. මිනිස් සන්තානය තුළ පහළවන හැඟීම් කෙබඳු එකක් දැයි පැහැදිලි වන්නේ එම හැඟීම් භාෂා මාධ්‍යයට පෙරළීමෙන් පසුවයි. අදහස් හා හැඟීම් ප්‍රවාහනය කිරීමේ මාධ්‍යය වශයෙන් භාෂාව වැදගත් තැනක් ගනී."[6]

මේ සියලු නිර්වචන දෙස අවධානය යොමු කරන කල්හි භාෂාව යන්න කුමක්දැයි අවබෝධ කර ගැනීමෙහිලා උපකාරි විය හැකි කරුණු කීපයක් සංග්‍රහ කොට දැක්විය හැකිය. එනම්,

- ❖ මිනිසා ප්‍රධාන කොට ඇති සත්ව වර්ගයා ඔවුනගේ හැඟීම් හා අදහස් ප්‍රකාශ කරන, කවර ක්‍රමයක් වුවද භාෂාව වෙයි.
- ❖ මිනිසුන් අතර හැඟීම් හා අදහස් සන්නිවේදනය කර ගන්නා මාධ්‍යය භාෂාවයි.
- ❖ භාෂාව වනාහි ක්‍රමවත් ලෙස සංවිධානය වූ ශබ්ද සංක්ත පද්ධතියකි.
- ❖ සමාජයක කොටස්කරුවන් අතර සම්මතයෙන් ඇති කරගත්, ක්‍රමාණුකූලව පිළියෙල කර ගත් වාග් සංකේත පද්ධතිය භාෂාවයි.
- ❖ මානව සමාජයේ සම්බන්ධතා ගොඩනගන මෙන්ම සංස්කෘතිය පරපුරෙන් පරපුරට ගෙන යන ප්‍රධාන මෙවලම භාෂාවයි.
- ❖ ජීව ලෝකයේ මිනිසා අසහාය තත්වයට පත්කෙරූ ප්‍රධාන මෙවලම භාෂාවයි.

479 - 14



- ❖ දැනුම ලබා ගැනීමටත්, දැනුම බෙදා දීමටත්, සංකල්ප සාධනයේදීත් භාෂාව මූලික වෙයි.

## භාෂාවේ ස්වභාවය

භාෂාව ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් මෙන්ම විධිමත් ස්වභාවයකින් යුක්තය. අධ්‍යනයේ පහසුව පිණිස තත් ස්වභාවය මෙසේ ගොණු කොට දැක්විය හැකිය.

- ❖ විධිමත් ශබ්ද රටා තිබිය යුතුය. - ශබ්ද
- ❖ විධිමත් රූප රටා තිබිය යුතුය. - අක්ෂර
- ❖ විධිමත් පද තිබිය යුතුය. - පද
- ❖ විධිමත් වාක්‍ය තිබිය යුතුය. - වාක්‍ය
- ❖ කථික හා ලිඛිත වශයෙන් බෙදී පවතියි.
- ❖ භාෂා භාවිතයේදි තත් භාෂක සමාජය විසින් ගොඩනගා ගත් නීති- රීති පද්ධතියක් පවතියි.
- ❖ පොදු බසින් මෙන්ම ඇතැම්විට උපභාෂා ලක්ෂණයන්ගෙන්ද යුක්ත වේ.
- ❖ චතුර්විධ ක්‍රියා කාරකම්වලින් (එනම් කථන, ශ්‍රවණ, කියවීම, හා ලේඛනය) යුක්ත වේ.
- ❖ ජනක ශක්තියෙන් යුක්තය. (නව නිර්මාණාත්මක සංකල්ප සාධනය)

ලෝකයේ මිනිසුන් විසින් භාවිත කෙරෙන සෑම භාෂාවක්ම ඉහත දැක් වූ ස්වභාවයෙන් යුක්තය. භාෂාවේ ව්‍යාකරණය භාෂාවෙන් භාෂාවට වෙනස් වෙයි. නමුත් භාෂාවේ සංයුතිය හෙවත් ස්වභාවය සෑම භාෂාවකටම පොදු ලෙස බල පැවැත් වේ. භාෂාවේ මේ පොදු ස්වභාවය භාෂාව භාවිත කෙරෙන තත් භාෂක සමාජය විසින් සම්මුතියෙන් එකගත්වයට පත් වූ

කරුණුය. පෞද්ගලිකව තත් සම්මුතීන් බිඳ දැමීමට කිසිවෙකුට බල පුළුවන් කමක් ඇත්තේ නොවෙයි. උප්පත්තියෙන් භාෂා ශක්‍යතාවක් ඇතිව උපදින දරුවා බහ තෝරණ අවධියේ සිටම මේ සම්මුතීන් පිළිබඳ ක්‍රමාණුකූල අවබෝධයක් ලබා ගනියි. ආත්මශක්තව හා සමාජීය වශයෙන් තත් අවබෝධය වර්ධනය කර ගනියි.

## භාෂා ව්‍යාකරණය

භාෂාවක් භාවිත කෙරෙන තත් භාෂක සමාජය විසින් භාෂාවේ පැවැත්ම උදෙසාත්, භාෂාවේ කාර්ය භාරය නිවැරදිව හැසිරවීම පිණිසත් පොදු සම්මුතියෙන් ගොඩ නඟා ගත් නීති - රීති පද්ධතිය භාෂා ව්‍යාකරණය වශයෙන් හැඳින් වේ. භාෂාවෙන් භාෂාවට මේ නීති- රීති රටාව වෙනස් වෙයි. "ව්‍යාකරණ" යන සංස්කෘත පදය සිංහල භාෂාවට තත්භව වන්නේ "වියරණ" යනුවෙනි. "වියරණ" යන්නෙහි සරලාර්ථය වන්නේ නිරුක්තාර්ථය දැක්වීම "විග්‍රහ කිරීම" යන්නයි.

"පද සිද්ධි ආදිය උගන්වන ශබ්ද ශාස්ත්‍රය ව්‍යාකරණය වේ."[7]

"The study or rules of a language is inflection or other means of showing the relation between words, including its phonetic system"[8]

භාෂාවක වචන වරනැගෙන රීතිය, වචන අතර සම්බන්ධතාව පෙන්වන්නා වූද, එහි ශබ්ද විචාර ක්‍රමවේදය අධ්‍යයනය කිරීම "ව්‍යාකරණය" වන බව ඉහත නිර්වචනයෙන් ධ්වනිත කෙරෙයි.

"භාෂාව පිළිබඳ නිරවද්‍ය ව්‍යවහාරය දක්වන්නා වූ නීති ශාස්ත්‍රය ව්‍යාකරණ නම්"[9]

479-15



භාෂාව නිවැරැදිව හැසිර වියයුතුය. එසේ නො වීමෙන් භාෂාවේ කාර්යභාරය නිවැරැදිව ඉෂ්ට නොවේ. තත් නිවැරැදිව හැසිරවීමේ ක්‍රමෝපාය ව්‍යාකරණ වන්නේය. ශිෂ්ට භාෂාව ව්‍යාකරණ නම් වූ භාෂා නීතියෙන් ආරක්ෂා වන්නේය. එය ආරක්ෂා කොට ඉදිරි පරම්පරාවට දායාද කිරීම තත් භාෂක සමාජයේ වගකීමක් වන්නේය.

"ව්‍යාකරණය යනුවෙන් අදහස් කරන්නේ කිසියම් භාෂාවක් භාවිත කරන ජන සමූහයක් විසින් එකී භාෂාව භාවිත කිරීම පිණිස පොදුවේ සම්මත කරගෙන ඇති සම්ප්‍රදායයි. මෙය 'භාෂාව භාවිත කරන සම්ප්‍රදාය' නමින්ද 'භාෂා රටාව' නමින්ද 'ව්‍යාකරණය නමින්ද හඳුන්වා දිය හැකිය. භාෂාවක දක්නට ලැබෙන ශබ්ද අක්ෂර පද, වචන, වාක්‍ය, යන භාෂා කොට්ඨාස එම භාෂක සමාජයේ පවතින පොදු සම්මුතියකට අනුව ගළපා ගැනීම භාෂාවේ සම්ප්‍රදාය හැටියට පෙන්වා දිය හැකිවෙයි."[10]

භාෂාවේ සංයුතිය නිසියාකාරව යෙදීම පිළිබඳව ඉගැන්වෙන නීති-රීති පද්ධතිය ව්‍යාකරණ බව ඉහත උද්ධෘතයෙන් තහවුරු කෙරෙයි. භාෂාවක් ඉගෙන ගන්නා ආධුනිකයාට තත් භාෂා ව්‍යවහාරයේ පවත්නා නීති - රීති පිළිබඳ මනා ශික්ෂණයක් තිබිය යුතුය. භාෂා ගුරුවරයා මෙන්ම ව්‍යාකරණ ගුරුවරයා කරන්නේ මේ ශික්ෂණය ආධුනිකයාට ලබා දීමයි.

"භාෂා ගුරුවරයා මෙන්ම වියරණ ඇදුරා භාෂාවක් පරිහරණය කරන ආකාරය කියා දෙන්නේ ව්‍යවහාරික ශික්ෂණයක් හැටියටය. ආධුනිකයාට ව්‍යක්ත භාෂාවෙහි ප්‍රභූත්වයක් ලැබීමට අවශ්‍ය සතතාභ්‍යාසය, වියරණ ඇදුරාගේ උපදෙස් අනුව ලැබිය යුත්තකි. භාෂාවක 'ව්‍යක්ත ව්‍යවහාරය' කුමක්දැයි තීරණය කරනු ලබන්නේ සමකාලීන ලේඛකයන්ගේ බහු සම්මතය මගිනි. වියරණ ඇදුරා කරන්නේ මේ බහු සම්මතය විමසා බලා එසේ ලිවීමට අවශ්‍ය ගුරූපදේශ විධිමත්ව ඉදිරිපත් කිරීම පමණෙකි."[11]

ඉහත නිර්වචනයෙන් පැහැදිලි කෙරෙන්නේ ව්‍යාකරණය වනාහි භාෂාවක 'ව්‍යක්ත ව්‍යවහාරය' බවයි. මේ ව්‍යක්ත ව්‍යවහාරය සදා කල්හි එකසේ පවත්නේ නොවෙයි. සමකාලීන විදග්ධ ලේඛකයන්ගේ බහු සම්මතයෙන් තත් භාෂාත්මක නීති - රීති වෙනස් කර ගත හැකිය. සෑම ජීව භාෂාවකම මේ ලක්ෂණය දැක ගැනීමට පුළුවන. භාෂා ව්‍යාකරණය වනාහි ශබ්ද - අක්ෂර- පද - වචන - වාක්‍ය පිළිබඳ පොදු සම්මුතියක ගළපා ගැනීම වේ.

## සිංහල භාෂාවේ වාක්‍ය හා වාක්‍ය රටා

ව්‍යක්ත ලෙස යම් කිසි පිළිවෙළකට, රටාවකට පද ගැළපීම වාක්‍යය යනුවෙන් හැඳින්විය හැකිය. භාෂාවක අක්ෂර සංයෝග වීමෙන් පද හා වචනත්, පද වචන සංයෝගයෙන් වාක්‍යයත් නිර්මාණය වෙයි. සම්පූර්ණ අදහසක් පළ කරන අයුරින් වචන සංවිධානය කර ගැනීම වාක්‍යයි. කථිත භාෂා ව්‍යවහාරයේදී මේ වාක්‍ය රටාව කෙරෙහි පැහැදිලිව පනවාගත් නීති- රීති සමුදායක් නැතත් තත් භාෂක සමාජයේ පිළිගත් සම්මුතික රටාවක් දැක ගැනීමට පුළුවන. කථනයේදී වාක්‍යයක අදහස එක් පදයකින්ද ධ්වනිත කළ හැකිය. රචනයේදී දෙබස් හා සංවාද යෙදෙන තැනකදී ඒ ලක්ෂණ දැකිය හැකිය.

උදා:-

| කථනයේදී | ලේඛනයේදී |
|---|---|
| A. උඹ ගෙදර ගියාද? | A. නුඹ ගෙදර ගියෙහිද? |
| B. ඔව් (හෝ) නෑ | B. I. මම ගෙදර ගියෙමි. |
| | II. මම ගෙදර නො ගියෙමි. |

එකම අර්ථ උද්දීපනයේදී මේ දෙයාකාර ලක්ෂණ දක්නට ලැබෙන්නේ ලේඛන ව්‍යවහාරය තුළ අන්තර්ගත ව්‍යාකරණය නිසාවෙනි. මේ උදාහරණයන්ගෙන් අපට පැහැදිලිව

479-16



පෙනෙන්නේ වචන නැමැති මූලික ඒකකයන්ගේ සංයෝගයෙන් බිහිවෙන රටා විශේෂය වාක්‍ය බවයි. පැරණි. වියරණ ඇදුරෝ වාක්‍ය නිර්මාණයට හේතු වන පද වර්ග 04 ක් දැක්වූහ.

I. නාම
II. ක්‍රියා
III. නිපාත
IV. උපසර්ග

මේ පදයන්ගේ සංයෝගයෙන් වාක්‍ය තැනේ. මෙහිදී මේ පද වර්ග 04 ම එකවැරම සම්බන්ධ විය යුතු යැයි නීතියෙක් නැත.

සිංහල භාෂාවේ ලේඛන ව්‍යවහාරයත් කථා ව්‍යවහාරයත් අතර ව්‍යාකරණමය වශයෙන් වෙනස්කම් රාශියක් දක්නට ලැබෙයි. මේ දෙඅංශයේම වාක්‍ය රීති පිළිබඳ අවධානය යොමු කිරීමට මෙහිදි අදහස් නො කෙරේ. ලේඛනය තැනෙන්නේ භාෂණය පදනම් කරගෙනය. ලේඛන නීතිය බොහෝ කාලයක් පවතින අතර කථන නීතිය ඉතා සුළු කාලයකින් වෙනස්විය හැකිය. ප්‍රාදේශීය වශයෙන්ද මේ කථන නීතිය වෙනස් වෙනස් ස්වරූප දරයි. එබැවින් අපගේ උත්සාහය වන්නේ සිංහල ලේඛනයේදී දක්නට ලැබෙන වාක්‍ය රටා පිළිබඳ අවධානය යොමු කිරීම පිණිසයි.

සිංහල ලේඛන රීතියේදී ප්‍රධාන වාක්‍ය රටා තුනක් දැක ගැනීමට පුළුවන.

1. සරල වාක්‍යය
2. සංයුක්ත වාක්‍යය
3. සංකීර්ණ වාක්‍යය වශයෙනි.

## සරල වාක්‍ය

කර්තෘ, කර්ම, ක්‍රියා, යන අංගත්‍රයෙන් යුක්ත කේවල වාක්‍ය සරල වාක්‍ය වශයෙන් ගැනේ. කර්තෘ යනු ක්‍රියාව කරන්නායි. කර්තෘගේ ක්‍රියාවට යටත් වන්නේ කර්මයයි. ක්‍රියාව විඳින්නේ, ක්‍රියාව හා බැඳෙන්නේ කර්මයයි.

උදා:- මිනිසා ගෙදර ගියේය/යයි/යන්නේය.
මිනිස්සු පන්සල් ගියහ/යති/යන්නෝය.
නුඹ කුඹුරට ගියෙහි/යහි/යන්නෙහි.
නුඹලා පාසලට ගියෙහු/යහු/යන්නෙහු.
මම නගරයට ගියෙමි/යමි/යන්නෙමි.
අපි නගරයට ගියෙමු/යමු/යන්නෙමු.

අතීත, අනාගත, වර්තමාන වශයෙන් පුරුෂත්‍රයේ ඒකවචන, බහුවචන වශයෙන් මේ සරල වාක්‍ය නිර්මාණය කර ගැනීමට පුළුවන.

සරල වාක්‍ය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙයි.

I. සකර්මක වාක්‍ය
II. අකර්මක වාක්‍ය

ඉහත දක්වා ඇති සියලු නිදසුන් සකර්මක වෙයි. ඒ සෑම වාක්‍යයකම කර්ම පදයක් යෙදී ඇත. කර්ම පදයක් නො යොදා ද සරල වාක්‍ය තනා ගැනීමට පුළුවන.

උදා:- සඳ බබලයි.
ගස වැටෙයි.
මල් පරවෙයි.

සම්පූර්ණ අදහසක් ප්‍රකාශ කෙරෙන අතර වාක්‍ය රචනාවේදී කර්ම පදයක් යෙදී නැත. යෙදී ඇත්තේ නාම පදයක් හා ක්‍රියා පදයක් පමණකි. ඇතැම් විටෙකදී නාම පද දෙකක් යෙදී සම්පූර්ණ අදහසක් පළ කරන වාක්‍ය නිර්මාණය කර ගැනීමට පුළුවන.



උදා:- ඌ ගොණෙකි.
ඇය ගායිකාවකි.
ඔහු නළුවෙකි. වශයෙනි.

## සංයුක්ත වාක්‍ය

කර්තෘ පද දෙකක් හෝ වැඩි ගණනක් ද ක්‍රියා පද කීපයක්ද යොදා ගනිමින් නිර්මාණය කර ගන්නා වාක්‍ය රචනා සංයුක්ත වාක්‍ය නමින් හැඳින් වේ.

උදා:-

I. මිනිසා වටපිට බලමින් ගී කියමින් නටමින් යයි.
II. මිනිසා ද ඇය ද, මම ද ගමට යමු.
III. ඔහු පාඩම් කරමින් ලියමින් හිඳියි.

මේ සංයුක්ත වාක්‍ය සඳහා පදනම වන සරල වාක්‍ය එක සමාන වෙයි. ඉහත දැක් වූ උදාහරණ මෙසේ සරල වාක්‍යවලට හැරවිය හැකිය.

I. I. මිනිසා වටපිට බලමින් යයි.
II. මිනිසා සින්දු කියමින් යයි.
III. මිනිසා නටමින් යයි.

II. I. මිනිසා ගමට යයි.
II. ඇ ගමට යන්නීය/ යයි.
III. මම ගමට යමි.

III. I. ඔහු පාඩම් කරමින් හිඳියි.
II. ඔහු පාඩම් ලියමින් හිඳියි.

## සංකීර්ණ වාක්‍ය

වාක්‍ය කීපයක් එකට ගැළපීමෙන් හා එයින් එක් වාක්‍යයක් ප්‍රධාන වීම මෙම වාක්‍ය රටාවේ විශේෂ ලක්ෂණයයි.

උදා:-

I. ඔහු උගන්වද්දී <u>මම සැපසේ නිදා ගතිමි.</u>
II. මිනිසුන් කලබල කරද්දී <u>අපි එතෙනට ගියෙමු.</u>
III. ඔහු වාදනය කරද්දී <u>ඇය තාලයට නැටුවාය.</u>

මෙම වාක්‍යයන්හි ඉරි ඇඳි වාක්‍ය ඛණ්ඩය ප්‍රධාන වී ඇත. එසේම සෑම වාක්‍යයකම වාක්‍ය දෙකක් සංයෝග වී ඇත. මෙවැනි වාක්‍ය රටා සංකීර්ණ වාක්‍ය රටා වශයෙන් හැඳින් වේ. මේ දැක් වූ වාක්‍ය රටාත්‍රය පුරුෂ භේදයෙන් ද (ප්‍රථම/මධ්‍යම/උත්තම) කාල භේදයෙන්ද (අතීත/අනතීත) වචන භේදයෙන්ද (ඒක වචන/බහු වචන) යුක්තව නිර්මාණය කර ගැනීමට පුළුවන.

මුනිදාස කුමාරතුංග මහතා සිංහල භාෂාවේ දක්නට ලැබෙන මේ වාක්‍ය රටා පිළිබඳ වෙනස්ම අර්ථ විග්‍රහයක් ඉදිරිපත් කරයි.

"නො අඩු එක් අර්ථයක් පවසන පද කුලය වාක්‍ය නමි."[12]
"වාක්‍යක ඇති වියැ හැකි අඩු මැ අඞ්ග ගණන දෙකයැ"

I. උක්ත
II. ආඛ්‍යාත[13]

එසේම සංයුක්ත හා සංකීර්ණ වාක්‍යයන්ට ගැළපෙන සේ "වාක්‍යයක ඇති වියැ හැකි වැඩිම අඞ්ග ගණන සතයැ

I. උක්ත
II. උක්ත විශේෂණ
III. ආඛ්‍යාත
IV. ආඛ්‍යාත විශේෂණ යන මේ සතයි."[14]
V. ආඛ්‍යාත පූර්ණ
VI. කර්ම
VII. කර්ම විශේෂණ



මේ බෙදීමෙන් පසුව නැවත ප්‍රධාන වශයෙන් වාක්‍ය වර්ග දෙකක් වේ යැයි පවසයි. එනම්

I. අමිශ්‍ර වාක්‍ය
II. මිශ්‍ර වාක්‍ය

වාක්‍ය දෙකකට හෝ වැඩියකට හෝ බෙදා වෙන් කළ නො හැක්කේ අමිශ්‍ර වාක්‍ය නමි.

සඳ නැඟේ.
මිනිසා ගොනු බඳී.
සඳ මනරම් වේ.

වාක්‍ය දෙකකට හෝ වැඩියකට හෝ බෙදා වෙන් කළ හැක්කේ මිශ්‍ර වාක්‍ය නමි.

මිනිසා සතුන් බඳී, ඔහු කෑමද දේ.
සමත් මිනිසා කුළු ගොනු රැහැනින් බඳී, ඔහු හීලෑ ද කෙරේ.
සඳ සෞම්‍ය වේ. අඳුරු ද දුරු කෙරේ."[15]

## කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය

කර්තෘ කාරක ආඛ්‍යාතයකින් යුක්ත වන්නේ කර්තෘ කාරක වාක්‍යයි. කර්ම කාරක අඛ්‍යාතයකින් යුක්ත වන්නේ කර්මකාරක වාක්‍යයි. ඒ අනුව කර්තෘ කාරක වාක්‍යක දැක ගත හැකි විශේෂ ලක්ෂණ කීපයකි.

- කර්තෘ කාරක ආඛ්‍යාතයක් ගනී.
- කර්තෘ උක්ත වේ.
- උක්ත කර්තෘ පෙර විබත් ගනී.

❖ කර්මය අනුක්ත වන අතර කර්ම පදය කර්ම විභක්තියෙන් සිටී.

කර්ම කාරක වාක්‍යද මේ ලෙසින්ම විශේෂ ලක්ෂණ කීපයක් පෙන්නුම් කරයි.

❖ කර්ම කාරක ආඛ්‍යාතයක් ගනියි.

❖ කර්ම පදය උක්ත වේ.

❖ උක්ත කර්ම පද පෙර විබත් ගනී.

❖ කර්තෘ අනුක්ත වන අතර කර්තෘ විභක්තියෙන් සිටියි.

පුරුෂත්‍රයේ මෙන්ම කාලත්‍රයේදීද ඒකවචන, බහුවචන භේදයෙන් යුක්තව කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය රටා නිපදවා ගැනීමට හැකිය.

උදා:-

01. අතීත කර්තෘ කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | වැද්දා සතුන් මැරී. | වැද්දෝ සතුන් මැරූ. |
| ම. පු. | තෝ සතුන් මැරීහි. | තොපි සතුන් මැරූහු. |
| උ. පු. | මම සතුන් මැරීමි. | අපි සතුන් මැරූමු. |

02. වර්තමාන කර්තෘ කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | ගොවියා කුඹුරු කොටයි. | ගොවියෝ කුඹුරු කොටති. |
| ම. පු. | තෝ කුඹුරු කොටහි. | තොපි කුඹුරු කොටහු. |
| උ. පු. | මම කුඹුරු කොටමි. | අපි කුඹුරු කොටමු. |

471-19



03. අනාගත කර්තෘ කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | ඔහු මල් පුදන්නේය. | ඔවුහු මල් පුදති. |
| ම. පු. | තෝ මල් පුදන්නෙහි. | තොපි මල් පුදන්නෙහු. |
| උ. පු. | මම මල් පුදන්නෙමි. | අපි මල් පුදන්නෙමු. |

01. අතීත කර්ම කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | ගොවියා විසින් කෙත රකුණු. | ගොවියන් විසින් කෙත රකිණි. |
| ම. පු. | පාලකයා විසින් තෝ රකිණිහි. | පාලකයා විසින් තොපි රකුණුහු. |
| උ. පු. | පියා විසින් මම රකිණිමි. | පියා විසින් අපි රකුණුමු. |

02. වර්තමාන කර්ම කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | මිනිසා විසින් කෙත රකේ. | මිනිසුන් විසින් මුවෝ මැරෙති. |
| ම. පු. | පියා විසින් තෝ රකෙහි. | පියා විසින් තොපි රකෙහු. |
| උ. පු. | මව විසින් මම රකෙමි. | මව විසින් අපි රකෙමු. |

03. අනාගත කර්ම කාරක

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. | මිනිසා විසින් ගස කැපෙන්නේය. | මිනිසුන් විසින් ගස කපන ලදහ. |
| ම. පු. | පියා විසින් තෝ රකෙන්නෙහි. | පියා විසින් තොපි රකෙන්නෙහු. |
| උ. පු. | මව විසින් මම රකෙන්නෙමි. | මව විසින් අපි රකෙන්නෙමු. |

479 - 20



කර්ම කාරක වාක්‍යයේදී "ලබ" "ලද" ධාතුයෙන් යුක්ත ක්‍රියාවද යෙදෙයි.

උදා:- ගොවියා විසින් ගොන්නු බඳිනු ලැබෙති.
ගොවියා විසින් කෙත රකින ලදී.
සහෝදරයා විසින් නැගණිය රකිනු ලැබේ.

## උක්තාඛ්‍යාත සම්බන්ධ විශේෂ රීති

උත්ත

වච් = වදනේ = කථා කිරීමේ

''අතීතෙ ත - තවන්තු - තාවි'' (බාලාවතාරය - කච්චායනය)

වච් + ත

මෙහිදී ''ව'' කාරයට ''උ'' ආදේශ වේ.

''උනාදි'' සූත්‍රය (පාණිනි) අතීත කෘදන්ත පද සාදාගනු ලැබේ.

වච් > උච් + ත = ''ත'' කාරයාගේ බලපෑමෙන් පූර්ව ව්‍යංජනය පර ව්‍යංජනයේ ස්වරූපය ගනී.

වච් > උච් + ත = උත්ත (උත්ත = කියන ලද ප්‍රකාශ කරන ලද)

## ආඛ්‍යාත

ආ + ඛ්‍යාතං ''පරද්වේ භාවො ඨානෙ'' (සුදුසු ස්ථානයේ පර අක්ෂරය ද්විත්ව වේ.)

ආඛ් + ඛ්‍යාතං

මෙහි ද්විත්ව වූ අක්ෂරය මහප්‍රාණ නම් එහි පූර්ව රූපයට අල්පප්‍රාණ අක්ෂරය ආදේශ වේ.

අක්ඛාතං = කරන්නා - විඳින්නා



01. උක්තය ඒක වචන වූ කල්හි අඛ්‍යාතය ඒක වචන වේ.

උදා:- I. හිරු නොනගියි අවරගිරේ.

II. සැපතෙහි විපතෙහි නොතැවෙයි නොසැලෙයි අටලෝ දම හුරු හෙළයා.

IV. අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ.

02. උක්තය ඒක වචන වුවද එය ගෞරවාර්ථයෙන් තබන කල්හි ඒ හා බැඳි ආඛ්‍යාතය බහුවචන වේ.

උදා:- I. මූසිලයාණෝ වෙණ වයති.

II. ගුත්තිලයාණෝ සිප් දෙති.

III. ඇදුරුතුමාණෝ මග නොමග කියාදෙති.

IV. සෝරත හිමියෝ ශබ්ද කෝෂය ලියූහ.

03. උක්තය බහුවචන වූ කල්හි ආඛ්‍යාතය බහුවචන වේ.

උදා:- I. දෙවියෝ රුවන් සක්මන් මැවූහ.

II. නාට්‍යාංගනාවෝ මනරම් නැටුමක් දක්වති.

III. ඇමතිවරු කථිකාවත් හදති.

IV. සාමා අමර විකුණති බස් පොලේ කජු.

04. උක්ත නාම පදය බහුවචන ද එය අප්‍රාණවාචී නම් ඒ හා බැඳී ක්‍රියාව ඒකවචන වෙයි.

උදා:- I. ගිරිහෙල් මුඳුනේ මානෙල් නොපිපේ.

හිරු නොනගියි අවර ගිරේ.

II. මහවැලි කලු කැලණි නදී
වලවේ ගිං සිසිල විදී
නිවහල් නව ගීත ගයයි.
නවෝදයට අසිරි පතයි.

III. ඉර හඳ නිසංසලයි.

05. අප්‍රාණවාචී උක්ත නාම පදය සචේතන බහුවචන ඕ - හු විභක්ති ප්‍රත්‍ය ගත් කල්හි ඒ හා බැඳි ක්‍රියාව බහු වචන වේ.

උදා:- I. ගංගාවෝ ගලා බසිති.
II. ගස්හු සුළඟින් වැටෙති.
III. පුෂ්පයෝ විකසිත වූහ.

06. සමූහාර්ථවාචී පදයක් ප්‍රාණවාචී නාම පදයක් සමග යෙදී උක්තය වශයෙන් සිටි කල්හි ආඛ්‍යාතය බහු වචන වේ. (රළ - පෙළ - කැල- ගණ - කැන් - පිරිස - රංචුව-නඩය - වැල - මුළු)

උදා:- I. මහත් ගජසෙන් සිටිති තැන තැන.
II. තමන් මනදොළ පුරති බිඟුරළ.
III. කෙසේ පවසති රුසිරු කිවි කැල.

07. සමූහාර්ථවාචී පදය පෙර විබත් ඒකවචන "ඒ" ප්‍රත්‍ය ගනී නම් ඒ හා බැඳි ක්‍රියාව ඒකවචන වෙයි.

උදා:- I. රජ ගෙට පිවිසි මැති ගෙණේ.
II. සඟ ගෙණේ දම් දෙසයි.
III. බමර ගෙණේ නිරිඳු පොබයා.

08. සමූහාර්ථවාචී පදයක් අප්‍රාණවාචී නාම පදයක් සමග යෙදෙන කල්හි ආඛ්‍යාතය ඒකවචන වෙයි.

479 - 21



උදා:- I. තරු කැළ අහසේ බබළයි.
II. සැඳෑ වළා පෙළ පෙනිණි.
III. මනකල්කමලුපුල් වන මිණි ගණ පෙනිණි.

## ස්ත්‍රී ලිංග උක්තය

01. ස්ත්‍රී ලිංග නාම පදයක් වාක්‍යයක උක්තය වශයෙන් යෙදෙන විට වර්තමාන කාලයේදී ආඛ්‍යාතය සාමාන්‍ය පරිදි යොදයි.

උදා:- I. චන්ද්‍රා ගී ගයයි/ගයන්නීය.
II. ආලෝකා පොත් බලයි/ බලන්නීය.
III. සුමාලි පොත කියයි/ කියන්නීය.

02. ස්ත්‍රී ලිංග උක්ත නාම පදය හා බැඳි ක්‍රියාව අතීත නම් එය බහු වචනයෙන් තැබීමද නිවැරැදි වේ.

උදා:- I. සුමනා දේවී රන්වන් පුතණු කෙනෙකුන් වැදූහ.
II. සභා තොමෝ සතුටින් විසිර ගියහ.
III. බැමිණි අඟනක් වූය පියකරු.

03. උක්තය ස්ත්‍රී ලිංග ඒක වචන වී අතීත කාලය හැඟ වුවද ආඛ්‍යාත ක්‍රියාව වෙනුවට නාම ක්‍රියාව යෙදේ නම් එම ක්‍රියා පදය ඒක වචන වෙයි.

උදා:- I. අම්මා බත් පිසුවාය.
II. සභා තොමෝ සතුටින් විසිර ගියාය.
III. සුමනා දේවී රන්වන් පුතණු කෙනෙකුන් වැදුවාය.

## ගෞරවාර්ථ බහුවචන ක්‍රියාව

01. උක්තය ඒක වචන ප්‍රකාශ කළත් ගෞරවාර්ථයෙන් යෙදී ඇත්නම් ආඛ්‍යාතය බහු වචන වේ.

උදා:- I. මහසත්හු අබිදම් දෙසූහ.

II. තෙරණුවෝ දම් දෙසති.

III. මෑණියෝ ඔවදන් දෙති.

02. **දෑ, පා, වහන්සේ** යන ගෞරවාර්ථ පද යෝගය

'දෑ' නිපාත යෝගයෙහි බහු වචන ආඛ්‍යාතයක් 'දෑය' යන්නෙන් වාක්‍ය අවසන් කෙරේ. **වහන්සේ** යන නිපාත යෝග යෙහි බහු වචන ආඛ්‍යාතය "**සේක**" යන්නෙන් අවසන් කෙරේ.

උදා:- I. හෙරණුන් දෑ පිඩු සිඟන දෑය.

II. මෑණියන් දෑ මෙසේ කීහ.

III. බුදුන් වහන්සේ දම් දෙසූ සේක/ දෙසන සේක/ දෙසති.

IV. රාහුල තෙරුන් වහන්සේ සැළලිහිණි සන්දේශය ලියූහ.

03. **ආණ, අණු, අණි** යන ගෞරවාර්ථ ප්‍රත්‍ය යෝගයෙහි ද ආඛ්‍යාතය බහුවචන වේ, **ආණ, අණු, අණි, ණ්ඩ, ණ්ඩි, පා,** **පාද**, යන ප්‍රත්‍ය සමග බොහෝවිට ''ඕ'' ප්‍රත්‍ය ගනු ලැබේ.

උදා:- I. පියාණෝ අනුශාසනා කරත්.

II. වෙදාණෝ බෙහෙදක් ඉදිකොට දුන්හ.

III. මලණ්ඩ සියල්ල අසා නිහඬ වූහ.

IV. අම්මණ්ඩි වට වන්දනාවේ ගියහ.

V. වළගම්බා නරපා කලක් වනගතව විසූහ.

04. **උඹ, මූ, මුබ, නුඹ** යන පද උක්ත වූ විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා:- I. උඹ තමන් තර්කවාදි හෙයින් ප්‍රශ්න විචාරා වහන්දෑට බොහෝ පීඩා කෙරෙති.

II. මුබ කොහි යන්නාහු ද?



05. කෙනෙක්, අයෙක්, අය, ඇතැමෙක්, කවුරු, සමහරු, සමහරෙක්, දෙනෙක්, යන පද උක්ත වූ විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා:- I. කෙනෙක් වැනසෙති හැනී හූල්වල

II. නටත් අයෙක් බහුරූ බැඳ

II. සමහරෙක් හරක් දක්වති.

06. ''අයෙක්, කෙනෙක් යන පද නියත බහුවචන වුවද අවශ්‍ය නම් ඒක වචනාර්ථයෙන් තැබිය හැකිය.

උදා:- I. හාමුදුරු කෙනෙක් පිඬු සිඟා වඩියි.

II. හිඟන අයෙක් මහ මග වැටී සිටියේය.

II. අන්ධ අයෙක් සුදු සැරයටියක් අතින් ගෙන ඇවිදියි.

## නිපාත යෝගයෙහි වාක්‍ය රටා

❖ **ද (ත්) නිපාත යෝගය**

01. සමුච්චයාර්ථවත් නිපාතයෙන් ප්‍රාණවාචි උක්ත පද කීපයක් එකට සම්බන්ධ වී උක්තය වශයෙන් සිටි කල්හි ඒ හා සම්බන්ධ වන ක්‍රියාව බහු වචනයෙන් සිටී. "ද" නිපාත වෙනුවට "ත්" යෙදුනත් මේ රීතිය අනුගමනය කෙරේ.

උදා:- I. ළමයා ද මිනිසා ද ආලෝකාද ගමට යති.

II. මුවාත් සාවාත් ගොණාත් තණ කති.

02. "ද" නිපාතය වෙනුවට සමුච්චයාර්ථය සඳහා "හා" නිපාතය යෙදුනත් මේ රීතිය ම අනුගමනය කෙරේ.

උදා:- I. නිර්මලා ද චන්ද්‍රා ද පාසැලට යති.

II. නංගී හා මල්ලී පාඩම් කරති.

03. ද (ත්) නිපාතයෙන් සමුච්චිත වන සෑම පදයක්ම උක්ත (ප්‍රථමා) විභක්තියෙන් තැබිය යුතුය.

උදා:- I. මිනිස්සු ද ළමයි ද කාන්තාවෝ ද ගොයම් කපති.
II. ක්‍රීඩකයෝ ද ප්‍රේක්ෂකයෝ ද ප්‍රීති වූහ.

04. "ද" නිපාතයෙන් සම්බන්ධ වන නාම පද අතර පුරුෂාර්ථ හඟවන පද තිබේ නම් ප්‍රථම පුරුෂ පදය වාක්‍යයේ මුලින් "ද" මධ්‍යම පුරුෂ පදය ඊළඟට "ද" උත්තම පුරුෂ පදය ක්‍රියාව සමීපයේ ද යෙදීම සාමාන්‍ය ලක්ෂණයයි. ආසන්නයේම යෙදෙන පුරුෂයට අනුව ක්‍රියාව බහු වචනයෙන් තැබිය යුතුය.

උදා:- I. ළමයා ද තෝ ද මම ද ගමට යමු.
- අපි

II. ඔබත් අම්මත් නිවස පිරිසිදු කරන්නෙහු.
- ඔවුහු

III. ආලෝකා ද චන්ද්‍රා ද ගමට ගියහ.
- නුඹලා

05. ද (ත්) නිපාතයෙන් සම්බන්ධ වන නාම පද අප්‍රාණවාචි නම් ආඛ්‍යාතය ඒක වචන වේ.

උදා:- I. ගස් ද කොළ ද ගෙඩි ද බිම වැටෙයි.
II. ගෙවල් ද පාරවල් ද නගර ද විනාශ විය.

06. සචේතන හා අචේතන ශබ්ද "ද" නිපාතයෙන් සම්බන්ධ වූ විටද ක්‍රියාව බහු වචනයෙන් තබනු ලැබේ.

උදා:- I. ළමයා ද රූපය ද වැඩෙති.
II. සීතා ද සුළඟ ද වනයට යති.



### ❖ හෝ නිපාත යෝගය

විකල්පාර්ථවත් "හෝ" නිපාතයෙන් උක්ත පද කීපයක් සම්බන්ධ වූ විට සමීපයෙන්ම ඇති උක්තයට අනුව ක්‍රියාව තැබේ. මෙහිදීද "ද" නිපාත යෝගයට අනුරූපවම උක්ත පද යෙදීම කළ යුතුය.

උදා:- I. ආලෝකා හෝ චන්ද්‍රා හෝ මම හෝ ගමට යමි.
II. මිනිසා හෝ තෝ හෝ එය ගත්තෙහිය.

### ❖ හෙවත් නිපාත යෝගය

සමානාර්ථවාචී "හෙවත්" නිපාත යෝගයේදී ළගම ඇති උක්තයට අනුව ක්‍රියාව යෙදීම සම්ප්‍රදායයි.

උදා:- I. පියා හෙවත් තාත්තා දරුවන් රකියි.
II. නරියා හෙවත් කැණහිලා කුකුළන් කයි.

### ❖ නොහොත් නිපාත යෝගය

විකල්පාර්ථවත් "නොහොත්" නිපාත යෝගය ද "හෝ" නිපාත යෝගයට අනුරූප වෙයි.

උදා:- I. ගාමිණී නොහොත් තෝ ගොවිතැන් කරහිය.
II. පියදාස නොහොත් මම පාසැල් යමි.

❖ සමුච්චාර්ථයෙහි "හා", "සහ" යන නිපාත සහිත වූ විට ද උක්තාඛ්‍යාත සම්බන්ධය 'ද' නිපාතය පිළිබඳ රීතියට අනුකූල වෙයි.

උදා:- I. පියා හා පුතා හා ගමනක් යති.
II. ගැමුණු හා තෝ හා වැඩ කරවු.

❖ 'හා','සහ' යන නිපාත 'සමග' යන අරුත සඳහා යෙදේ නම් ඒ නිපාතයන්ට මුලින් යෙදෙන්නේ අනුක්ත පදයකි.

උදාඃ- I. ළමයින් කැටුව මම ද යමි.

II. සුරත් සහ සහසැස් නොකර සිටියේ අහස් කුස් හිස්.

(මෙන්, සේ, සෙයින්, වනි, එව්, ලෙස, විලස, බඳු, අයුරු, තුරු, අතුරෙන්, අතුරෙහි, කරා, වෙත, කෙරෙහි, ළඟ, ගැන, සම්බන්ධයෙන්, සහ, සමග, කැටුව, එක්ව, විනා, මිස, මුත්, හැර, උදෙසා, නිසා, සඳහා, වත්, පිණිස, අරබයා, විසින්, ලවා, වශයෙන්, වගේ, වගෙයි, වෙනුවෙන්, තුළ, වෙනුවට, සිට, මත, අනුව.)

❖ ශ්‍රැතිසුචනාර්ථයෙහි යෙදෙන 'ල', 'ලු' නිපාත යෙදෙන විට උක්තාඛ්‍යාත සම්බන්ධය සාමාන්‍ය වාක්‍යක මෙන් සිටී. එනම් උක්තයට අනුකූලවම සිටී.

උදාඃ- I. රජ බුදුන් දක්නට යේල.

II. වැසියෝ රජුට මෙසේ කියත් ලු.

II. සියලු මැති ඇමතිවරු සහභාගි වෙත්ලු.

❖ අවිනිශ්චිතාර්ථවත් 'වි' නිපාතය යෙදෙන විට කර්තෘ අනුක්ත වන අතර ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් සිටී.

උදාඃ- I. රජු වැසියන් සනසා වි.

II. මේ දුක දෙවියන් බලා වි.

❖ ප්‍රශ්නාර්ථයෙහි යෙදෙන 'ද' නිපාතයෙන් යුක්ත වූ විටද උක්තාඛ්‍යාත සම්බන්ධය සාමාන්‍ය රීතිය අනුව පවතී.

උදාඃ- I. ඒ මිනිසා කුමක් කරයි ද?

II. ඔවුහු කුමක් පවසත් ද?

❖ 'ව' ධාතුවෙන් නිපන් ආඛ්‍යාත වෙනුවට 'ය' නිපාතය යෙදුව ද උක්තයෙහි වෙනසක් සිදු නොවේ.



උදාඃ- I. හේ ගොවියෙක් වේ - හේ ගොවියෙක් ය.

II. ඔවුහු ගුරුවරු වෙති - ඔවුහු ගුරුවරු ය.

III. ඕ නිළියක් වන්නීය - ඕ නිළියක්ය.

❖ ආඛ්‍යාතය වෙනුවට 'ඇත', 'නැත' යන නිපාත යෙදුණ ද ඒ හා බැඳි නාම පදය උක්තාර්ථවත් විය යුතුය.

උදාඃ- I. සියලු දුක් හා නුමුසු අමා මහ නිවනක් ඇත.

II. උත්තරයක් දෙන එකද සතෙක් නැත.

II. ගුරු නිවහනේ කඳුළට උල්පතක් වෙලා

ලොකු හාමිනේ ඇත බිතු සිතුවමක් වෙලා.

❖ ඇත, නැත ක්‍රියා රූප ලිංග හා වචන භේදය අනුව ද සකසා භාවිත කළ හැකිය.

උදාඃ- I. මම ඉතිහාසය හදාරා ඇත්තෙමි.

II. හාමිනේ ගොවිකමට හුරුකම් ඇත්තීය.

III. ගුරුතුමිය පාසලට පැමිණ ඇත්තීය.

IV. දිළින්දෝ වස්තු දේපළ නැත්තෝය.

❖ වාක්‍ය දෙකක් සම්බන්ධ කිරීම සඳහා 'නම්', 'ද' යන නිපාත යෙදීමේදී මුල් අන්තර් වාක්‍යයෙහි උක්තාඛ්‍යාත සම්බන්ධය සාමාන්‍ය රීතිය අනුව පවතී.

උදාඃ- I. බ්‍රහ්මයෙක් වී නම් ආකාශයෙන් යෙයි.

II. තෝ ඉදින් උන් කරා ගියෙහි නම් තාගේ යසස් පිරිහෙයි.

❖ කෝ 'කොයිද? කවරහුද? ආදී පද යොදා ප්‍රශ්න ඇසීමේ දී වුව ද උක්තය ප්‍රථමාවෙන් තැබීම සිංහල රීතියයි.

උදාඃ- I. තකා ආ සමනෝ කොයි ද?

II. පාසැලෙහි ගුරුවරු කවරහු ද?

III. මේ ගෙදර සිටි මිනිස්සු දැන් කෝ ?

❖ **මොනවද, කෙසේද, ඇයි, ඇයිද, කවරදාද, කවදාද වැනි** ප්‍රශ්නාර්ථවාචී ක්‍රියාපදයක් වාක්‍යක යොදන කල්හි ඒ හා බැඳි කර්තෘ පදය අනුක්ත වේ.

උදා:- I. ළමයින් පාසල් නොඑන්නේ ඇයි ?

II. උපවාසයේ යෙදුණු ශිෂ්‍යයන් ඉල්ලා සිටියේ මොනවාද?

III. එසේ කළ විට උසස් කාන්තාවක වන්නේ කෙසේද?

❖ **මෙන්, වැනි, විනා** නිපාත පද යෝගයන්හි කර්ම විභක්තිය යෙදෙන බව පැරණියන් ගේ ඉගැන්වීම යි.

උදා:- I. ඔහු මෙන් මම සමතෙක් නො වෙමි.

II. ළමයින් විනා අපි එහි නො යමු.

මෙම නිපාත යෝගයන්හි කර්ම විභක්තියට අමතරව වෙනත් විභක්ති ද යෙදෙන ආකාරය දක්නට ලැබේ.

උදා:- I. ඔබගේ විනා මගේ කාර්යයක් නො වේ.

II. ඔබ අතෙහි විනා මා අතෙහි වරදක් නැත.

❖ කෙනෙකු විසින් කළ යුතු දෙයක් ඇඟවීම සඳහා ඇතැම් විට භාව කෘදන්ත නාමයෙන් පරව **සෑහේ, නො සෑහේ, වටී, නො වටී, යුතු යි, යුතු ය.** නිපාත පද අවසාන ක්‍රියා පද වශයෙන් යොදනු ලැබේ. එවිට ද කර්තෘ අනුක්ත විභක්ති ගනී.

උදා:- I. ළමයින් මෙසේ කිරීම සෑහේ.

II. අප ද මේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම වටී.

එසේ වුවද 'යුතු' යන්න ආඛ්‍යාත ප්‍රත්‍යයක් සමග යෙදුණු විට උක්තය ප්‍රථමා විභක්ති ගනී.

උදා:- I. මම මහණ දම් පිරිය යුත්තෙමි.



II. මිනිස්සු මීට වගකිව යුත්තෝය.

❖ එම මොහොතේම සිදුවන ක්‍රියාවක් හැඟවීම සඳහා යෙදෙන 'තිබේ' යන ක්‍රියාව සමග යෙදෙන උක්තය කර්ම විභක්ති ගනී.

උදා:- I. ළමයින් ගෙදර ගොස් තිබේ.

II. දක්ෂ වඩුවන් උවමනා කර තිබේ.

❖ වැකියක අසම්භාව්‍ය ක්‍රියාව කරන බවක් හඟවන පදය අනුක්ත රූපයෙන් සිටියි.

උදා:- I. ගුරුවරුන් පැමිණෙද්දී සිසුහු නැගී සිටියහ.

II. ප්‍රේක්ෂකයෙකු ආවොත් ඔවුහු රඟ දක්වති.

III. ඔවුන් පහර දුන්නොත් අපි පළා යන්නෙමු.

❖ ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ දී කර්තෘ හඳුන්වන නාමය අනුක්ත වේ.

උදා:- I. වෙද මහතා සේවකයන් ලවා බෙහෙත් සාදවයි.

II. තෙරණුවෝ දායකයන් ලවා මළුව අමදවති.

III. කුමාර මහතා මා ලවා දේශනය කරවයි.

## සංශයාර්ථය

සැකයක්, ආරංචියක්, වාර්තා කිරීමක්, දැනීමක්, සිතීමක්, බලාපොරොත්තුවීමක්, විශ්වාස කිරීමක්, අවිශ්වාස කිරීමක්, වැනි අදහසක් ප්‍රකාශ වේ නම් එය සංශයාර්ථයි. කිසියම් අන්තර් වාක්‍යකින් සංශයාර්ථයක් ප්‍රකාශ කෙරේ නම් එම අන්තර් වාක්‍යයේ උක්තය අනුක්ත විභක්තියෙන් තැබීමත්, ඊට සම්බන්ධ ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ බහු වචනයෙන් තැබීමත්, සිංහල භාෂාවේ විශේෂ රීතියකි. ප්‍රධාන වාක්‍යයේ උක්ත ආඛ්‍යාතයේ කිසිදු වෙනසක් සිදු නොවේ. ප්‍රධාන වාක්‍ය හා අන්තර් වාක්‍ය සම්බන්ධ කිරීමේදී 'යි', 'හෝ' යන නිපාත යොදා ගැනේ.

උදා:- I. මීයන් වෙණ කති යි අඳ මවුපිය දෙදෙන අත්පුඩි ගැසූහ.

II. අප සිප් නොදනිති යි තෝ නොසිත.

සමහර තැනක 'යි' නිපාතය වෙනුවට ආඛ්‍යාත පදයෙහි අවසාන ස්වරය දීර්ඝව යෙදේ.

උදා:- විසිතුරු මෙපුර වර අඟනන් වෙමින් ලොල
පියයුරු යටින් බැඳ වසතී සිතේ බල

සමහර විටෙක වාක්‍ය සම්බන්ධ කරන්නට 'යි' නො යෙදී ආඛ්‍යාතය පමණක් යෙදී ඇති අයුරු දක්නට ලැබේ.

උදා:- I. අඩු වැඩි සුරඟනන් උගනිති හැඟේයා.

II. තොප එක් වේලේ වළඳති යනු අසා එක් වේලේ වළඳයි.

## ද්විත්ව උක්තය

01. සමහර වාක්‍යන්හි උක්ත පද දෙකක් දක්නට ලැබෙයි. 'ව' වීමෙහි ධාතුව අකර්මක නිසා එයින් නිපදෙන ආඛ්‍යාතය අසම්පූර්ණ වේ. සම්පූර්ණ අර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා ආඛ්‍යාත පූර්ණයක් යොදනු ලැබේ. එය උක්තයට සමානව සම ලිඟු, සම විබත්, හා සම වචන ගනී. කුමාරතුංග මෙය හඳුන්වන්නේ ද්විත්ව උක්තය හැටියටයි.

උදා:- I. අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.

II. ළමයා උත්සහවන්තයෙක් වෙයි.

02. ඇතැම් විටෙක 'ව' ධාතුවෙන් නිපන් ක්‍රියාව වෙනුවට වාක්‍ය අවසානය ඇඟවීම සඳහා 'ය' නිපාතය යොදනු ලැබේ. එවිට ද අනුගමනය කරනු ලබන්නේ මෙම රීතිමයි.

උදා:- I. මම මිනිසෙක් ය. (වෙමි)



II. තොපි සිංහලයෝ ය. (වෙහු)

03. ප්‍රශ්නාර්ථවාචී 'ද' නිපාත යෝගයෙහි ද අනුගමනය කරන්නේ ද මේ රීතියමය.

උදා:- I. ශිෂ්‍යයෝ දක්ෂයෝ ද?

II. ක්‍රීඩකයෝ දක්ෂයෝ ද?

04. අධ්‍යාහාර උක්ත අඛ්‍යාතය

උදා:- I. සිඟමන් යදිමු සා ගින්දර නිවන්නට

II. දුටුගැමුණු කුලේ පාමු
අධ්‍යහාර උක්තය

III. සාමයේ මල් රටට පිපෙන්නට - දළඳා සමිඳුට බාරවෙමු.

I. අපි ඔක්කොම රජවරු

II. අපි ඔක්කොම වැසියෝ අධ්‍යාහාර ආඛ්‍යාතය

III. අපි ඔක්කොම නෑදෑයෝ

මේ ආකාරයෙන් සිංහල භාෂාවේ විවිධ වාක්‍ය රටා දැක ගැනීමට පුළුවන. කථන ව්‍යවහාරයේ දක්නට ලැබෙන වාක්‍ය රටා මෙයිට වඩා හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ගන්නා බවද පෙනේ. උච්චාරණ ධ්වනිය අනුව ඇතැම් වාක්‍ය ප්‍රකාශන, අවධාරණාර්ථ, විධානාර්ථ වශයෙන් ද පෙනී සිටියි. සිංහල භාෂාවේ වාක්‍ය රටා පිළිබඳ විවිධ ආකාරයෙන් විමර්ශනය කළ හැකි වුවත් ලේඛන ව්‍යවහාරයට අතිශයින්ම වැදගත් වාක්‍ය රටා කීපයක් මෙහිදී ඉදිරිපත් කිරීමෙන් මේ නිබන්ධනය හමාර කරන්නේ ලිපියෙහි සංක්ෂිප්තතාව උදෙසාය. නැතහොත් මේ මාතෘකාවට අදාළ වෙනමම විශාල ග්‍රන්ථයක් ලිවිය යුතු වෙයි. විශේෂයෙන්ම උසස් පෙළ සිංහල විෂය ධාරාවට ඇතුළත් වී ඇති ව්‍යාකරණ රීති සීමාවෙන් ඔබ්බට මේ ලිපිය දීර්ඝ කිරීම අනවශ්‍ය යැයි හැඟේ.

## ආන්තික සටහන්

1 ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ද්විතීය භාගය, සංස්:- වැලිවිටියේ සෝරත හිමි, 1970, අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, පි.අ. 715.

2 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, **තුලනාත්මක වාග්විද්‍යාව**, 2000, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි.අ. 33.

3 Edward sapir, **Language** , Encylopeadia of the social sciences, vol 9, 1949,p.01.

4 **The concise oxford Dictionary of curent English . English** ed by R.E. Allen , 1990, Delhi oxford University press, Culcuta, p. 665.

5 Block, B, and Trager. G.L., **Outline of Linguistics Analysis,** 1942, balimore, p. 05.

6 සුමනසාර හිමි, තිඹිරිවැව, **සිංහල භාෂාවේ ව්‍යාකරණ**, 1996, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ පි.අ. 02.

7 **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය**, වැලිවිටියේ සෝරත හිමි, 1970, අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, පි.අ. 984.

8 **Oxford Dictionary- English - English** e.d by R.E. Allen,1990, Delhi oxford University press, Culcuta, p. 665.

9 මුනිදාස, කුමාරතුංග, ව්‍යාකරණ විවරණය, 2000, එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. පි.අ. 01.

10 සුමනසාර හිමි, තිඹිරිවැව, **සිංහල භාෂාවේ ව්‍යාකරණ**, 1996, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ පි.අ. 03.

11 දිසානායක, ජේ.බී. **භාෂාවක භාවිතය හා විග්‍රහය**, 2005, ආර්. එස්. ප්‍රින්ටෙක් මුද්‍රණය, මල්වාන, පි.අ. XIX.

12 කුමාරතුංග, මුනිදාස, **ව්‍යාකරණ විවරණය**, 2000, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි.අ. 295.

13 එම, පි.අ. 296.

14 එම, පි.අ. 298.

15 එම, පි.අ. 299.